**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතුනිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

---

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරවූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජංගම ගිණුමක් 2020 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.111,277 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 11 ක් පැවතියද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් සටහන viii හි එනම්, බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ එම තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් නව බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ ඇතුළත් කර නොමැති බව. | එක් එක් ආකෘතියෙහි අඩංගු විය යුතු තොරතුරු හෙළිදරව් කළ යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ACA – P ආකෘතියෙහි දේපල පිරියත සහ උපකරණවල වටිනාකම රු.1,098,889,538 ක් වුවද SA-82 පරිගණක මුද්‍රිත අනුව එම වටිනාකම රු.1,093,110,764 ක්ද ACA – 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය අනුව එය රු.1,259,396,760 ක් ද විය. ඒ අනුව දේපල හා පිරියත උපකරණ අදාළ ලේඛන සමඟ නොසැසඳුණි. | නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වෙනස්වීම් වලට අදාළ හේතු හඳුනාගෙන ගිණුම්වලට අවශ්‍ය ගැලැපීම් නිවැරදිව කළ යුතු වීම. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් වත්කම් අයිතම 10 ක වටිනාකම හා SA-82 භාණ්ඩාගාර පරිගණක මුද්‍රණයන්හි හි සඳහන් වටිනාකම් අතර රු.9,477,195 ක වෙනස්කම් පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇති රජයේ නිවාස 14 ක් පැවතියද ACA-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය යටතේ රජයේ නිවාසවල කිසිදු වටිනාකමක් දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් අවසන් වටිනාකම් හා පරිඝණක මුද්‍රිත SA 80 මූල්‍ය නොවන වත්කම් සාරාංශයේ හි සඳහන් වටිනාකම් අතර රු.5,778,777 ක වෙනසක් විය. | -එම- | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂය ඊට අදාළ ලේඛන සමඟ සැසඳිය යුතු වීම. |

**1.6.3 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයේ තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් තැන්පතු වර්ෂය තුළ බැර කිරීම රු.569,219 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එය රු.574,837 ක් වූයෙන් රු.5,618 ක වෙනසක් විය. එමෙන්ම එම ගිණුමේ වර්ෂය තුළ හර කිරීම් රු.611,186 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එය රු.616,803 ක් වූයෙන් හර කිරීම්වලද රු.5,617ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරගන්නා බව | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් රු.1,374,800,000 ක අයවැය ප්‍රතිපාදන සලසා තිබුණද රු.1,264,154,000 ක් පමණක් ලැබී තිබුණි. එබැවින් වැය විෂයය අංක 289-2-1-2202 යටතේ සංවර්ධන සහායන් සඳහා සලසා තිබුණු රු.600,000,000 ක ප්‍රතිපාදනයෙන් වියදම් කර තිබුණේ රු.529,161,029 ක් පමණක් වන අතර අක්මුදල් නොලැබීම නිසා එම ප්‍රතිපාදනයෙන් රු.70,838,971 ක් ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. | අනුමත අග්‍රිමවලින් උපරිම ප්‍රයෝජන ගෙන සැලසුම්ගත ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 3 ඡේදයේ නියමයන්ගෙන් බැහැරව රු.13,915,000 ක් වසර ආරම්භයේ සැලසුම්කළ වාර්ෂික අයවැය ප්‍රතිපාදනයට මුදල් රෙගුලාසි 66 යටතේ රු.1,400,000 ක් වෙනත් වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන මාරු කරගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරිය යුතු වීම. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරීන් සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) පාර්ලිමේන්තු පනත් | | | |
| 2003 අංක 22 දරන බීජ පනතේ 8(1) වගන්තිය | ලියාපදිංචි නොවූ පැළ තවාන්කරුවන් 38 දෙනෙකු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පැළ සපයා තිබුණි. | පනත අනුව සංශෝධනයන් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>-----------------<br>xii පරිච්ඡේදය 1.3 වගන්තිය | කාර්යාල 07 කට අයත් නිලධාරීන් 41 දෙනෙකු දින 101 ක් නිවාඩු අනුමත කර නොගෙන සේවයට වාර්තා නොකළ අවස්ථා පැවතුණි. | විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කළ බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------<br>මුදල් රෙගුලාසි 115 | කාර්යාල 02 කට අදාළ ඉකුත් වර්ෂයේ ගෙවීම් වවුචර් 300 ක් සඳහා මුදල් රෙගුලාසි විධානයන්ගෙන් බැහැරව 2020 වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවීම් සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි 115 අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිසම විසින් අනුමත කළ කාර්යය පටිපාටික රීති මාලාවේ xviii පරිච්ඡේදයේ 193 ඡේදය | එක් කාර්යාලයක නිලධාරීන් 07 දෙනෙකු වසර 07 සිට වසර 17 දක්වා කාලයක් එකම ස්ථානයේ සේවය කරන බව නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය. | වසර 05 ඉක්මවා ඇති නිලධාරීන්ට ස්ථාන මාරුවීම් ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | කාර්ය පටිපාටික රීතීවලට අනුගතව කටයුතු කළ යුතු වීම. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඵලදායීතා ප්‍රවර්ධන ආයෝජන ව්‍යාපෘතිය යටතේ ගම්මිරිස්, කරදමුංගු ආදී අපනයන බෝග වගාකරුවන් සඳහා වගාකර තිබෙන පැළ ප්‍රමාණය සහ වගා භූමි වපසරිය පදනම් කරගෙන දිරි ගැන්වීමේ ආධාර ගෙවා තිබුණි. 2020 වර්ෂයේදී එසේ ආධාර ගෙවීම පිළිබඳ නියැදි පරීක්ෂාවේදී එක් අවස්ථාවකදී කරදමුංගු පැළ සඳහා රු.26,250 ක්ද අවස්ථා 3 කදී ගම්මිරිස් පැළ සඳහ රු.206,040 ක්ද චක්‍රලේඛ විධිවිධානයන්ගෙන් බැහැරව වැඩිපුර ගෙවා තිබුණි. | මෙම ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටු පත් කර ඇති අතර එම කමිටු නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ගෙවීම් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතු අතර වැඩියෙන් ගෙවා ඇති මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු විම. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ සේවය කර සේවය අතහැර ගොස් තිබූ සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.443,945 ක ණය ශේෂයෙන් රු.232,965 ක් වසර 04 ක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | නිලධාරීන් දෙදෙනෙකුගෙන් තවදුරටත් අයකර ගත යුතු රු.377,095 ක මුදල අයකර ගැනීම සඳහා නීතිපති උපදෙස් පරිදි අයකර ගැනීමට කටයුතු කරන බවත් අනෙක් නිලධාරියාගෙන් අයවිය යුතු ණයශේෂ ඇපකරුගෙන් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ස්ථාන මාරුවී ගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.234,820 ක ණය ශේෂ වසරකට වඩා පැරණි ඒවා විය. | ණය මුදල් ගෙවන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව. | ලබාදුන් ණය නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 01 දිනැති අංක 3/2020/iv දරන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.4.8 ඡේදය අනුව අපනයන කෘෂි භෝග ප්‍රවර්ධන වැඩසටහන යටතේ ආයෝජන ආධාර ලබා දීම සඳහා තෝරාගන්නා සෑම ප්‍රතිලාභියෙකුටම අපනයන කෘෂි භෝග ඵලදායීත්වය නැංවීම පිළිබඳව පුහුණු වැඩසටහනක් සඳහා යොමු කිරීමට කටයුතු කළයුතු වුවත් ඇතැම් ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස සියළුම අධ්‍යක්ෂක වරුන් දැනුවත් කළ බව | චක්‍රලේඛ විධිවිධාන අනුව ප්‍රතිලාභීන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතු වීම. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.1,448,138 ක් වූ මුල්හාල්කැලේ හා මිද්දෙණිය මධ්‍යම පැළ තවාන්වල ක්ෂුද්‍ර ජල සම්පාදන ව්‍යාපෘති 2019 දෙසැම්බර් 20 දින වැඩ නිම කර භාර දිය යුතුව තිබුණ ද මාස 08 ක කාල ප්‍රමාදයකින් පසුව 2020 අගෝස්තු මස වැඩ නිම කර භාර දී තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. | ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘති නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | විගණන පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.4 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති දෙකක් රු.1,448,138 ක් වැය කර ස්ථාපිත කර තිබුණි. එකී ප්‍රසම්පාදනයට අදාළව කොන්ත්‍රාත්කරු සමග එළඹි ගිවිසුමේ 5 වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව නිම කරන ලද දින සිට වසරක කාලයක් කොන්ත්‍රාත්කරු විසින් නඩත්තු කළ යුතු අතර නඩත්තු කාලය තුළ අවසන් බිල්පතෙන් සියයට 10 ක මුදලක් රඳවා ගත යුතු වේ. එහෙත් එම අවශ්‍යතාවය නොසලකා 2020 අගෝස්තු මස සම්පූර්ණ බිල් වටිනාකම් ගෙවා තිබුණි. | 2021 අගෝස්තු 26 දින වන තෙක් යම් දෝෂයක් ඇති වුවහොත් ගිවිසුමට අනුව අවශ්‍ය කටයුතු සිදු කර දෙන බවට 2021 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් අදාල සමාගම එකඟවී ඇති බව. | නඩත්තු කාලය තුළ මූල්‍යමය බැදීමක් තබාගත යුතුවීම. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 නොවැම්බර් මස එකක් රු.34,191 බැගින් 200 ක්ද, 2020 අගෝස්තු මස එකක් රු.38,088 බැගින් 100 ක්ද , වශයෙන් රු.10,647,000 ක් වැය කර ටැබ්ලට් පරිගණක 300 ක් මිලදී ගෙන තිබුණි. | - | - |
| (i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව අස්ථිත්වය විසින් වසර 3 ක අපේක්ෂිත ප්‍රසම්පාදන ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | නිවැරදිව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. |
| (ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශය අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශ අනුව සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේදී මිලදී ගනු ලැබූ ටැබ්ලට් පරිගණක 300 ක ප්‍රමාණයෙන් රු.4,996,809 ක් වටිනා ටැබ් පරිගණක 136 ක් 2020 දෙසැම්බර් 15 වන විටත් භාවිතයට නොගෙන ගබඩා කර තිබුණි. | 2021 වර්ෂයේදී ටැබ් පරිගණක බෙදාදීමට කටයුතු කළ බව. | රාජ්‍ය මුදල් ඵලදායී ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුවීම. |

**3.6 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාරම්මල අන්තර් බෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ ශෂ්‍ය විද්‍යා හා පාංශු පෝෂණ අංශයෙහි ශාක හා පස් නියැදි විශ්ලේෂණය කිරීම සඳහා 2017 වර්ෂයේදි රු.840,650 ක් වැයකර මිලදී ගෙන ස්ථාපිත කර තිබුණු ජෙල්ඩාල් නිස්සාරන යන්ත්‍රය (Kjeldahl Distillation unit) Digestion unit නම් උපයෝජන යන්ත්‍රය නොමැති වීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි. | 2021 වර්ෂය තුළදී ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බව | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළයුතුවීම. |
| (ආ) | වියලුව ව්‍යාප්ති නිලධාරී නිවස මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | නිල නිවාසය සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වාර්තාවක් ලබාදෙන ලෙස දන්වා ඇති බව. | ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ඇ) | සිගාස් මෘදුකාංගය ඇතිළි සලකුණු මෘදුකාංගය හා කාර්යාල දත්ත පරිගණක මඟින් සිදු කිරීමේදී විදුලිය ක්‍රියා විරහිත වන අවස්ථාවලදී හා අධික විදුලිය පැමිණෙන අවස්ථාවලදී එම මෘදුකාංග සහිත පරිගණකවලට හානි වීමේ අවදානමක් පැවතීම හේතුකොටගෙන මිලදී ගත් යූපීඑස් 30 ක් 2020 ජූලි සහ අගෝස්තු මාසවලදී ගබඩාවට ලැබී තිබුණු නමුත් එයින් රු.69,700 ක් වටිනා යූපීඑස් 17 ක් 2021 පෙබරවාරි 11 දින වන විටත් එනම් මාස 6 කට අධික කාලයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන දෙපාර්තමේන්තු ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව. | වත්කම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු වීම. |

## 3.7 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂවලදී සිදුව තිබුණු අලාභ සිද්ධි 5කට අදාළව එකතු වටිනාකම රු. 74,455 ක් 2020 වර්ෂය තුළදී පොත්වලින් කපාහැර තිබුණු අතර සිද්ධි 4 කට අයත් රු.4,076,808 ක අලාභ තවදුරටත් අයකර ගැනීමට හෝ අත්හැරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වගාකරුවන්ට දැනුම ලබාදීමේ අරමුණු ඇතිව මුද්‍රණය කර 2018 ජූනි මස ගබඩාවට ලැබී තිබුණු පිරිවැය රු.579,341 ක් වූ කාර්මික ප්‍රකාශන පොත් 13,333 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ ඉතිරිව තිබුණි. මෙම පොත් වසර 2 1/2ක පමණ කාලයක් ගබඩා තුළ පැවතීම මේ සඳහා දරන ලද වියදම අනාර්ථික වියදමක් විය. | මින් ඉදියට වාර්ෂික අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන රජයේ මුදල් ඵලදායී වන අන්දමට භාවිතා කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන බව | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රකාශන මුද්‍රණය කිරීමට සැලැසුම් කළ යුතු වීම. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 01 දිනැති අංක 3/2020/iv දරන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 1.2.2 ඡේදය අනුව ආයෝජන ආධාර ලබා ගැනීම සඳහා ඉඩමේ අයිතිය සනාථ නොකළ ඉල්ලුම්කරුවන් සිව් දෙනෙකු සඳහා රු.493,000 ක් ගෙවා තිබුණු බව නියැදි පරීක්ෂණවලදි අනාවරණය විය. | ආයෝජන ආධාර ඉල්ලුම් කරන සියළුම ඉල්ලුම්කරුවන්ගේ අයිතිය සනාථ කිරීමේ ලිපි ලේඛන ලබාගැනීමටත්, චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන ලෙසත් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරුන් දැනුවත් කළ බව. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |

4. තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම
-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘ න්‍යාය පත්‍රය ’’ පිළිබඳ ව දැනුවත් වී සිටියද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළඟා වීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිරසර ඉලක්ක හඳුනා ගනිමින් පවතින බව. | තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත්වීම හා ක්‍රියාත්මක වීම කෙරෙහි අවධානය යොමුකළ යුතුවීම. |
| (ආ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දැක්වෙන පාර්ශවයන් හඳුනාගත හැකි වුවද, ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාළ ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවුණි. | 2021 වර්ෂයේදී තිරසර ඉලක්ක හඳුනා ගැනීම සඳහා වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් නිවැරදි කාර්යසාධන දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී කාර්යය සාධන දත්ත පදනමක් බිහිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | -එම- |

5. මානව සම්පත් කළමනාකරණය
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 20 න් 15 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු වූ අතර දිස්ත්‍රික් විෂයානුබද්ධ ව්‍යාපෘති නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 15 ක් පැවතුණි. එය දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි. | ඉදිරියේදී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව. | අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් එතෙක් සිටින කාර්ය මණ්ඩලය මගින් අරමුණු කරා ගමන් කිරීමට පියවරගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 84 ක් අනුමත කර තිබුණු නමුත් එම තනතුර සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | ඉදිරියේදී බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කිරීම සඳහා සැලැසුම් කර ඇති බව. | -එම- |